ඩබ්.පී.සී. වික්‍රමරත්න මහතා 2019.10.22

සභාපති

විගණන සේවා කොමිෂන් සභාව

නො. 35 ඒ,

ආචාර්ය එන්.එම්. පෙරේරා මාවත,

කොළඹ 08.

**<u>ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ වංචා හා දූෂණ පිළිබඳව කෙරෙන දැනුම් දීමයි.</u>**

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට මේ වන විට මුහුණ දෙන්නට සිදුවී තිබෙන අභාග්‍යසම්පන්න තත්වය පිළිබඳව ඔබතුමන්ව දැනුවත් කිරීම මෙම ලිපියේ අරමුණයි.

අවු. 160 කට ආසන්න පෞඪ ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවේ ජාතික දුරකථන සැපයුම්කරු වන ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මේ වන විට දරුණු ලෙස අර්බුධයකට පත්ව ඇත්තේ පවතින කළමණාකාරීත්වයේ අදූරදර්ශී ක්‍රියාවන් හේතුවෙනි.

ආයතනය තුල පවතින නාස්තිය, දූෂණය, පමණක් නොව, අනවශ්‍ය වියදම් හේතුවෙන් මේ වන විට බිලියන 70 කට ආසන්න දීර්ඝ කාලීන සහ කෙටි කාලීන ණය බැංකු අයිරා රාජ්‍යය හා රාජ්‍ය නොවන බැංකු වලින් ලබාගෙන ඇත. මෙසේ ආයතනය තුල දිගින් දිගටම ගැටළු පැණනගින මොහොතකදී සභාපති ප්‍රමුඛ අධ්‍යක්‍ෂක මණ්ඩලය ඇතුළු ඉහල කළමණාකරණය මෙම ගැටළු වලට කිසිදු විසඳුමක් ලබා නොදෙමින් ඉතා අත්තනෝමතික පාලනයක් ගෙන යමින් සිටී.

ආයතනයේ වංචා දූෂණ පිළිබඳව මුලිකවම සොයා බැලිය යුතු අභ්‍යන්තර විගණක අංශයේ ප්‍රධානියා ලෙස සේවය කරන්නේ වයස 60 ඉක්මවූ නිළධාරියෙකි. ටෙලිකොම් සභාපතිගේ හා ඉහළ කළමනාකාරීත්වයේ දුවමනා එපාකම් ඉටු කරමින්, ආයතනයේ කිසිදු දූෂණ කටයුත්තක් පිළිබඳව නොසොයන එම නිලධාරියාද රිසි සේ ටෙලිකොම් මුදලින් කා බී ප්‍රිතිවෙයි. දිනපතා රාත්‍රි සමාජශාලා හා හෝටල් වල කා බී ප්‍රීති වන ඔහු පසු දා එම ගෙවීම් සියල්ල ටෙලිකොම් මුදලින් ලබා ගැනීම සඳහා බිල්පත් ඉදිරිපත් කරන්නේ කිසිඳු ලැජ්ජාවක් නොමැතිවය.

විගණන අංගය තුල මෙසේ දූෂණ කටයුතු සිදු වෙද්දී සෙසු අංග පිළිබඳව සොයා බැලීම උගහටය. ආයතනයේ දූෂණ වංචා පිළිබඳව සොයා බැලීමේදී මෙම නිළධාරියාට පෙර, රාජකාරි කළ නිලධාරීන් විසින් විමර්ෂණ සිදු කිරීමට නියමිතව තිබූ ලිපිගොනු සියල්ල හමස් පෙට්ටියට යවා එම දූෂණ හා එයට සම්බන්ධ නිලධාරීන්ට නිදැල්ලේ සිටීමට ඉඩ දී තිබේ.

මීට අමතරව ආයතනයේ වාහන අවභාවිතය පිළිබඳව ද පවතින්නේ ඉතා දරුණු තත්ත්වයකි. දැනට ටෙලිකොම් ආයතනය සතුව තිබෙන වාහන (උදා- සුඛෝපභෝගි ජීප් රථ) අව භාවිතයේ යොදවයි. ටෙලිකොම් ආයතනයෙන් මුදල් ගෙවා දේශපාලඥයින්ට කුලී වාහන ලබා දී තිබේ. ටෙලිකොම් වාහන අවභාවිතයේ යොදවන්නේ අනුබද්ධ ආයතන වලට ලබා දීමෙන් හා සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා භාවිතයට ලබා දීමෙනි. තවද ටෙලිකොම් සභාපතිවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලය නමින් විශාල සේවක සංඛ්‍යාවක් නීති විරෝධී ලෙස බඳවාගෙන ඒ සඳහා විශාල වැටුප් ගෙවමින් යාන වාහන සහ ඉන්ධන ලබා දෙමින් සහ ටෙලිකොම් සහ එහි අනුබද්ධ ආයතන වලට නීති විරෝධී ලෙස අනුයුක්ත කර ඇත.

පහත සඳහන් වාහන ටෙලිකොම් ආයතනය මගින් කුලී පදනම මත ලබාගෙන විදුලි සංදේශ හා ඩිජිටල් ඇමතිවරයාට, නියෝජ්‍ය ඇමතිවරයාට සහ හිටපු ප්‍රධාන විධායක නිළධාරිවරයාටත් දැනට සිටින සභාපතිවරුන්ටත් ලබා දී තිබේ.

| වාහන අංකය | සැපයුම්කරු | ලබා දී ඇති නිළධාරියා | මාසිකව කුලිය ලෙස ගෙවන මුදල |
|---|---|---|---|
| PE – 8813 | Shakya Tours | ඇමතිවරයා | රු. 140,760.00 |
| KV – 6161 | Wayamba Traders | නියෝජ්‍ය ඇමතිවරයා | රු. 373,750.00 |
| PE – 3301 | Shakya Tours | ඇමතිවරයා | රු. 140,760.00 |
| CAM – 7894 | Pioneer Tours | හිටපු ප්‍රධාන විධායක නිළධාරි | රු. 350,00.00 |
| PC – 8608 | Shakya Tours | ඇමතිවරයා | රු. 140,760.00 |
| CAS – 7172 | Shashigo Tours | සභාපතිතුමා | ගෙවීම සිදු කරන්නේ DGM/OPEX මගිනි |
| CAA – 1221 | Ben 10 Tours | ඇමතිවරයා | රු. 320,000.00 |
| KN - 0415 | Comtec | ඇමතිවරයා | රු. 80,000.00 |

LTE ව්‍යාපෘතියෙහි තාක්ෂණික ඇගයීම් කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳව එසේම ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය සම්බන්ධවද, එමෙන්ම ප්‍රධාන විධායක නිළධාරියා විසින් හුවාවේ (Huawei) ආයතනයට විශේෂ වරප්‍රසාද ලබා දීම මතද මෙම ව්‍යාපෘතියේ අක්‍රමිකතා සිදුවී ඇත. එමෙන්ම ප්‍රතිලාභ නොමැති බව දැන දැනත් බිලියන ගණනින් මුදල් වියදම් කර ඇත. එමෙන්ම Core Network 2 ව්‍යාපෘතිය සඳහා යොදා ගැනීම මත ඒ සඳහා විශාල මුදලක් වැය කිරීම සම්බන්ධයෙන් පාඩු සිදු කර ඇත.

මීට අමතරව ටෙලිකොම් ආයතනයේ ක්‍රියාත්මක වන විවිධ ව්‍යාපෘතිද මේ වන විට කිසිදු වැදගැම්මකට නැති සුදු අලින් බවට පත්වී තිබේ. එයට එක් උදාහරණයක් වන්නේ ශ්‍රී ලංකා රජයේ පූර්ණ අනුග්‍රහය මත එනම් රාජ්‍ය තොරතුරු තාක්ෂණ ආයතනය (ICTA) යටතේ ක්‍රියාත්මක වූ රාජ්‍ය

ජාල පද්ධති 2 (LGN 2) ව්‍යාපෘතියයි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අදාල **ගනුදෙනුකරු** තෝරා ගැනීමේදී බරපතල වංචා දූෂණ රාශියක් සිදුවී තිබේ.

ICT ආයතනය විසින් මෙම ව්‍යාපෘතියට අදාල RFP (Request For Proposal) පිළියෙල කරනු ලැබුවේ එකතරා සැපයුම්කරුවෙකු පමණක් අරමුණු කරගෙන බවට සාක්ෂි ඇත.

මෙම ටෙන්ඩරය සඳහා ICT ආයතනය විසින් RFP පිළියෙල කිරීමේ සිට ටෙන්ඩරය සැපයුම්කරු වෙත භාර දීම දක්වා ශ්‍රී ලංකා ටෙලිකොම් සහ ICT ආයතනය යන ආයතන දෙකම දේශපාලන සහ අනිකුත් බලපෑම් මත ඉතාමත් දූෂිත ලෙස කටයුතු කර ඇති බව සාක්ෂි ඇති අතර එය විමර්ශනයකින් දැනගත හැකිය. EZY නැමති, මීට පෙර ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සමග කිසිම ව්‍යාපෘතියට සම්බන්ධ නොවූ ආයතනයකි.

පරිගනක මෘදුකාංග හා දෘඩාංග ඇතුලු අනෙකුත් Server උපකරණ Check Point නැමති නිශ්පාදනයක් සහිත ඊශ්‍රායල් සමාගමකට භාර දෙන ලදී. එහි දේශිය නියෝජිතයා වන්නේ SAT (South Asia Technologies) ආයතනයයි.

මෙම ගිවිසුම අනුව සේවාවන් පමාවීම සඳහා ටෙලිකොම් සමාගමට ගෙවිය යුතු දඩ මුදල් සඳහා සඳහා EZY ආයතනය විසින් ටෙලිකොම් සමාගමට විශාල දඩ මුදලක් අය කර ගැනීමට කටයුතු කළ නිළධාරියා ටෙලිකොම් කළමණාකාරීත්වය විසින් එයින් ඉවත් කර, එම ගිවිසුමද EZY ආයතනයට අවශ්‍ය පරිදි සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ඉතා අවාසිදායක වන පරිදි වෙනස් කරන ලදී. එමගින් ගිවිසුමේ ප්‍රකාර ටෙලිකොම් සමාගමට ලැබිය යුතු විශාල මුදලක් අහිමි වූ අතර එය සෘජුවම සේවා තත්ත්වයන්ටත් බලපා ඇත.

මෙම LGN 2 ව්‍යාපෘතියේ ටෙන්ඩර් කැඳවීම සිදුකර ඇත්තේ Site 860 ක් ආවරණය වන පරිදි සේවා සපයන්නන්ගෙන් (Service Provider) මිල ගණන් කැඳවමිනි. බිලියන 4 කට ආසන්න වටිනාකමකට මෙම ටෙන්ඩරයේ මිල ගණන් කැඳවා ඇති අතර System integrator සහ උපකරණ සැපයුම්කරු තෝරාගෙන ඇත්තේ සාමාන්‍ය ටෙන්ඩර් පරිපාටියෙන් තොරවය. ටෙලිකොම් ආයතනයේ ලියාපදිංචි වූ පහත සඳහන් සැපයුම්කරුවන් වෙත ටෙන්ඩර්පත් යවා ඇති නමුත් ජාල පද්ධති සම්බන්ධයෙන් කිසිදු පළපුරුද්දක් නැති ආයතනයකට මෙම ටෙන්ඩරය ලබා දී තිබේ.

1. MIT – Millennium Information Technologies
2. EZY Corporation

3. Fentons

4. EVIS

5. JIT

මේ අතරින් EZY නම් ආයතනය තෝරා ගෙන ඇත්තේ ඔවුන්ට ජාල පද්ධති කළමණාකරණය පිළිබඳ කිසිදු ජාල පුරුද්දක් නොමැති පසුබිමක සිටය. මෙහි පුදුමය දනවන කරුණ වන්නේ EZY ආයතනය විසින් තම උප කොන්ත්‍රාත්කරු ලෙස MIT ආයතනය තෝරාගෙන ඔවුනට මෙම ජාල පද්ධති මෙහෙයුම් කටයුත්ත පැවරීමයි.

මෙම EZY නම් ආයතනය භාණ්ඩ බෙදාහැරීමේ ආයතනයක් ලෙස පමණක් කටයුතු කරන ආයතනයකි. අප වෙත ලැබී ඇති තොරතුරු අනුව EZY ආයතනයේ අයිතිකරු වන සෆ්රාස් නැමැත්තා සහ හරින් ප්‍රනාන්දු ඇමතිවරයා අතර ඉතා ළඟ සම්බන්ධතාවයක් ඇති බවයි.

මෙම LGN ව්‍යාපෘතියේ දෙවන අදියරද ස්ථාන 2500 ක් සඳහා ටෙන්ඩර් කැඳවීමට නියමිතව ඇති අතර,එහි වටිනාකම රු.බිලියන 6 කි. එයද පෙර කී EZY ආයතනයට ලබා දීමට කටයුතු කර ඇති බව දැනගන්නට ලැබී තිබේ. සාමාන්‍යයෙන් ප්‍රසම්පාදන අංශය මගින් සැපයුම්කරුවන් තේරීමේදී කළයුතු ක්‍රියා පරිපාටිය මේ අයට සිදු නොවන අතර තාක්ෂණික ඇගයීමක් (Technical Evaluation) මෙහිදී සිදුකර නොමැති බව කියැවේ.

මෙහි ව්‍යාපාරික තත්වය (Business case) සහ සැපයුම්කරු තෝරාගත් ආකාරය පිළිබඳව විගණනය කළ යුතුව ඇත. මෙකී EZY ආයතනය සමග ටෙලිකොම් ආයතනය අත්සන් කළ ගිවිසුමේ ටෙලිකොම් ආයතනයට ඉතා අවාසිදායක කොන්දේසි ඇති බව දැනගන්නට ලැබී තිබේ.

මෙහි Business Case සාදා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත්තේ 100 kbps/sec සම්බන්ධතාවයක් (Link) එකක් සෑම සම්බන්ධිත රාජ්‍ය ආයතනයක් (Site) සඳහා එකකටම සේවා ලබා දෙන බව පොරොන්දු වෙමිනි. එසේම මේ ව්‍යාපෘතියේ ටෙලිකොම් ආයතනයට ඇති පැතිකඩ ආන්තික (Profit Margin) අගය 5% කට වඩා අඩුය. එසේම දැනට ටෙලිකොම් ආයතනයට රු.මි. 1000 කට වැඩි හිඟ බිල්පත් (Bill arrears) මෙම ආයතනයෙන් අයවීමට ඇත.

මීට අමතරව ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමග, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ජාල පහසුකම් ලබා දීම සඳහා ගිවිසුමක් අත්සන් කරන ලදි. එම ගිවිසුමට අනුව ජාතික ඉතිරි කිරීමේ බැංකුව ටෙලිකොම් ආයතනයට බදු මුදල් ගෙවිය යුතු අතර, ටෙලිකොම් ආයතනය විසින් JIT ආයතනයට නැවත බදු

මුදල් ගෙවිය යුත්තේ මෙම ජාල පහසුකම් සැපයීම් ව්‍යාපෘතියේ (end equipment provider) JIT ආයතනය වන බැවිනි. මෙහිදී JIT ආයතනය විසින් පසුව ඉල්ලුම් කළ බදු මුදල වන රු.මි. 11.3 ක් ටෙලිකොම් හිටපු අලෙවි ප්‍රධානි අජන්ත සෙනෙවිරත්න මහතාගේ අනුමැතිය යටතේ ගෙවා ඇත. මෙම ගෙවීම සඳහා ප්‍රධාන විධායක නිළධාරිගේ අනුමැතිය ලබාගෙන නොමැති අතර, මෙවැනි විශාල මුදලක් ප්‍රධාන නිළධාරිවරයෙකුගේ අනුමැතියෙන් ගෙවිය නොහැකිය.

එසේම පාරිභෝගිකයින් සඳහා උපකරණ ගැනීමේදී තත්ව පරීක්ෂණයෙන් අසමත් වූ භාණ්ඩ මිලදී ගැනීමෙන් ආයතනයට විශාල පාඩුවක් සිදුකර ඇත. එම උපකරණ වල දෝෂ සහගත තත්වය හේතුවෙන් පාරිභෝගිකයින්හට නොයෙකුත් ගැටළු වලට මුහුණ දීමට සිදුවී ඇත. එමෙන්ම අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් උපකරණ මිලදී ගැනීම මත ගබඩාවේ යල්පැන ගිය උපකරණ ගොඩ ගසා ඇත.

ATEL LTE පාරිභෝගික උපකරණ මිලදී ගැනීමේදී එවකට සිටි ප්‍රධාන විධායක නිළධාරියා විසින් එම සැපයුම්කරුගෙන් භාණ්ඩ මිලදී නොගන්නා ලෙස දන්වා සිටියද එම සමාගමෙන්ම භාණ්ඩ මිලදී ගැනීමට ආයතනය කටයුතු කිරීමෙන් අක්‍රමිකතාවයක් සිදුකර ඇත.

WIMAX ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී තාක්‍ෂණය මිලදී ගැනීමෙන් පමණක් නොව ඒ සඳහා උපකරණ ගෙන්වීමෙන්ද ආයතනයට විශාල පාඩුවක් සිදු කිරීම.

MSAN සඳහා කාලගුණයට ඔරොත්තු නොදෙන බැටරි ගෙන්වීමෙන් සිදුකර ඇති අක්‍රමිකතාව නිසා ආයතනයට පාඩු සිදු කිරීම.

තඹ කේබල් විකිණීමේදී 2016 වර්ෂය සඳහා ටෙන්ඩර් නොකැඳවා පෙර සමාගම් වලටම භාර දී ඇති අතර විනිවිධභාවයකින් එය නොකිරීම හා මුදල් ලබා ගැනීමකින් තොරව කේබල් ඉවත් කිරීමට අවසර දීම.

ආදායම් සහතික කිරීම හා වංචා කළමණාකරණ (Revenue Assurance & Fraud Management) ව්‍යාපෘතියේදී අවම මිල ගණන් දුන් සැපයුම්කරුවකු ඉවත්කොට ඉහල මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුට ව්‍යාපෘතිය ප්‍රධානය කිරීම. මෙයින් POC (Proof of Concent) වලදී සිදුවූ ඇති අක්‍රමිකතා.

ඉහත කී සියලු කරුණු වලට අමතරව ටෙලිකොම් කළමණාකාරීත්වය මගින් සිදු කරන ලද අපූරුතම ප්‍රතිව්‍යුහගතකරණය මගින් ඉහළ කළමණාකාරීත්වය පමණක් සතුටු කිරීම සඳහා නව තනතුරු 57 ක්

පමණ ඇති කර ඇති අතර, සාමාන්‍යාධිකාරී තනතුරු 16ක් දට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු 31 ක්ද (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් 16 ක් සාමාන්‍යාධිකාරී තනතුරු වලට පත් වූ පසු) ප්‍රධාන නිළධාරී යන නියෝජ්‍ය ප්‍රධාන නිළධාරී සහ නියෝජ්‍ය ප්‍රධාන නිළධාරී තනතුරු 14 ක්ද, ප්‍රාදේශිය කළමණාකරුවන් 14 ක් ද බාහිර රෝහණ මධ්‍යස්ටාන කළමණාකරුවන් 7 ක්ද පත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙසේ උසස්වීම් ලබන නිළධාරීන් වෙනුවට පිටතින් ඉංජිනේරුවන් 100ක් පමණ බඳවා ගෙන ඇත. 2018 වසරේ මෙසේ සිදු කරන ලද ප්‍රතිව්‍යුහගතකරණයට අමතරව 2019 වසර පුරාවටම ප්‍රතිව්‍යුහගතකරණය භවිත කරමින් කිසිදු චක්‍රලේඛයක් නිකුත් නොකර, විවිධ තනතුරු හොර රහසේම ලබා දීම සිදුවෙමින් පවති.

මේ සම්බන්ධයෙන් මීට පෙරද ඉහත කරුණු පිළිබඳව ටෙලිකොම් වෘත්තියස සමිති කීපයක් මගින් කෝප් කමිටුව වෙතද දැනුම් දී ඇති නමුත්, ජනාධිපති සොයුරු ටෙලිකොම් සභාපතිවරයා විසින් මෙම විමර්ශන යටපත් කර තිබේ.

එම නිසා විගණන කොමසම මගින් හැකි ඉක්මනින් මේ පිළිබඳව විමර්ශනය කර ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ආරක්‍ෂා කර දෙන ලෙස ඉල්ලා සිටිමු.

පිටපත් (විගණන සේවා කොමිශන් සභාවේ සියලුම සාමාජිකයන් වෙත)

1. නිහාල් සුනිල් රාජපක්‍ෂ මහතා
2. ගාමිණි අබේරත්න මහතා
3. වී. කන්දසාමි මහතා
4. ඩබ්.ඒ.එස්. පෙරේරා මහතා